ඇමුණුම 01

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ **අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)** තනතුරේ පුරප්පාඩු **01** ක් පවතින අතර, එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ **1 පන්තියේ I ශ්‍රේණියේ** නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැතිව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කරනු ලැබූ අයදුම්පත්‍රයක් **2023.11.30** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත යොමු කරන ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)" තනතුර සඳහා ඉල්ලුම්පත** ලෙස සඳහන් කළ යුතුය.

**<u>අයදුම්පත් එවිය යුතු ලිපිනය</u>**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්,**
**අංක 306/71,**
**පොල්දූව පාර,**
**බත්තරමුල්ල.**

03 . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා හා 2017.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කරනු ලැබේ.

**I .සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පිළිවෙල පහත දක්වා ඇත.**

**<u>ලකුණු පටිපාටිය</u>**

| | පරීක්ෂා කර ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **01** | **<u>සේවා පළපුරුද්ද - 60</u>** | |
| | I. තනතුරට අදාළ ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය වසරක් සඳහා ලකුණු 05 ක්ද වසරකට අඩු මාස 06 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 02 ½ ක්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | **50** |
| | II. ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ ලෙස) අදාළ පූර්ව පළපුරුද්ද (උපරිම වසර 05ක් සඳහා) වෙනුවෙන් වසරකට ලකුණු 02 බැගින් ද මාස 06 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 01 බැගින් ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | **10** |
| | **<u>කුසලතාවය - 40</u>** | |
| **.02.** | **I.** අධ්‍යාපන සුදුසුකම් | |
| | නිලධාරීන් සේවයට බඳවා ගැනීමේ දී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාළ හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාළ වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක්කරනු ලැබේ.<br>අ.) පශ්චාත් උපාධිය - ලකුණු 15<br>ආ.) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 10 | **15** |

**II. වෘත්තීය සුදුසුකම්**

**(අ) i.** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - **ලකුණු 10** 10

(දේශීය / විදේශීය)

**ii.** එම ක්ෂේත්‍රයේ මාස 06 ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා -**ලකුණු 05**

**(ආ)** ආයතනය විසින් තීරණය කරන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සම්පූර්ණ කරන ලද අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certifications ) සඳහා කාලසීමාව නොසලකා ඉහත **2 (II ) (අ) (i)** යටතේ සැලකීමට ලක් කෙරේ.

උදා: 1) BCS/ACS

2) Microsoft Certifications

3) Sun Certifications

4) Cisco Certifications

5) CISSP Certifications

6) etc…

**III. විශේෂ කාර්යයන් / දායකත්වයන්**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව සිදුකරන ලද නව නිර්මාණ, වැඩිදියුණු කිරීම හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ. 10

(අ) නව නිර්මාණ, වැඩිදියුණු කිරීම් , ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා - **ලකුණු 10**

(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍යාංශ ලේකම්/ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ප්‍රශංසා 01 ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05 ක් සඳහා පමණක් එනම්, උපරිම ලකුණු 05ක් පමණක් ලබා දෙනු ලබන අතර අයදුම්කරුවෙකුට ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 05 ක් ලබාගැනීමෙන් පසු ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා මෙම සුදුසුකම් යටතේ ලබාදෙන ඉතිරි ලකුණු 05ක් ද ලබා ගත හැකිය.

**ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා උදාහරණ:**

1) මෘදුකාංග නිර්මාණය/ සංවර්ධනය (Software Designing / Development)

2) ජාල පරිපාලනය (Network Administration)

3) පද්ධති පරිපාලනය (System Administration)

4) දත්ත පාදම පරිපාලනය (Data Base Administration)

5) සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.)

**සැ.යු.**

- නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් අයදුම්කරු විසින්ම සිදු කළ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.
- ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබාගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| | **IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>අ.) නායකත්වය - ලකුණු 02<br>ආ.) සන්නිවේදන කුසලතාවය - ලකුණු 02<br>ඇ.) වෘත්තීය ආචාරශීලීභාවය - ලකුණු 01 | **05** |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

දිනය: 2023/11/10

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

පී.එම්.පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක: 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.


ලිපිනය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

දුරකථන අංකය - 011 - 2147001
ෆැක්ස් අංකය - 011 - 2147011
ඊ මේල් ලිපිනය - anurakumara@statistics.gov.lk